# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2014 ජනවාරි මස 07 වන දින පෙ.ව 09.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. ලිපි ලේඛන පිළිගැන්වීම
III. කාරක සභා වාර්තා පිළිගැන්වීම
IV. පෙත්සම්
V. ප්‍රශ්න

**01.** ගරු සිරිකමල් පිලිෂියන්ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2013.11.05 දින අසන ලද ප්‍රශ්නය: **(ප්‍ර/V (1)13/15)**

අ. පමුණුගම රෝහලේ මාතෘ නිවාසය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව ඔබතුමා දන්නවාද ?

ආ. එම රෝහලේ රසායනාගාරය අක්‍රියව පවතින බව ඔබතුමා දන්නවාද ?

ඇ. එම රෝහලේ බාහිර රෝගී අංශය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව ඔබතුමා දන්නවාද ?

ඈ. රෝහල් කාර්ය මණ්ඩලය අතර ඇති අසමගිභාවය නිසා රෝගීන් සහ පරිපාලනය අපහසුතාවයට ලක් වී ඇති බව ඔබතුමා දන්නවාද ?

ඉ. මෙම තත්වය පිළබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද ?

**02.** ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.11.26 දින අසන ලද ප්‍රශ්නය : **(ප්‍ර/v(1)13/16)**

අ. ඔබ අමාත්‍යංශය ප්‍රතිපාදන යටතේ ත්‍රීරෝද රථ සඳහා මීටර් ලබා දුන්නේද ?

ආ. එම මීටර් වර්ගය හා නිෂ්පාදන නාමය කුමක්ද?

ඇ. එක මීටරයක මිල කීයද?

ඈ. කොපමණ මීටර් සංඛ්‍යාවක් බෙදා දුන්නේද?

ඉ. එම මීටර් සඳහා කොපමන මුදලක් වැය කලේද ?

ඊ. කෘෂිකර්ම අමාත්‍යංශයේ කර්මාන්ත අධිකාරිය මගින් ලබා දුන් ත්‍රීරෝද රථ මීටර් වර්ගයට වඩා ඔබ අමාත්‍යංශය ලබාදුන් මීටර් වල ඇති වෙනස කුමක්ද?

උ. ඔබ අමාත්‍යංශය මගින් ලබාදුන් මීටර් සවිකරන ලද ත්‍රීරෝද රථ වල අලවා ප්‍රදර්ශනය කරන ස්ටිකරයේ මහරගම නගර සභාවේ සභාපතිතුමියගේ ඡායාරූප ද ඇතුලත් කර ඇත්තේ කුමන පදනමකින්ද?

03. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා කරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.11.26 දින අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/v(1)13/17)

අ. ඔබතුමාගේ අමාත්‍යංශය යටතේ හා ඊට අදාල ආයතන යටතේ පසුගිය වසර පහ තුල ඔබතුමා සහභාගී වූ විදේශ සංචාර ගණන කොපමණද ?

ආ. සංචාරය කල රටවල් මොනවාද?

ඇ. කුමන කාරණා සඳහාද?

ඈ. වසර 05 ක කාලය තුල විදේශ සංචාර සඳහා ඔබ අමාත්‍යංශය හා ඊට අදාල ආයතන වියදම් කල මුදල් වාර්ෂිකව වෙන වෙනම කොපමණද?

ඉ. එකී විදේශ සංචාර වල යෙදුන දින වකවානු මොනවාද?

ඊ. ඔබතුමා සමග මෙකී විදේශ සංචාර වලට සහභාගී වූ නිලධාරීන් පිළිවෙලින් කව්රුන්ද?

උ. ඔවුන් තෝරාගත් පදනම කුමක්ද?

ඌ. එකී සංචාර සඳහා වැය කල මුදල් වාර්ෂිකව වෙන වෙනම කොපමණද?

එ. මීට අමතරව මෙම කාලය තුල ඔබතුමා වෙනත් අමාත්‍යංශ ප්‍රතිපාදන යටතේ විදේශ සංචාර වල නියැලුනේද ?

ඒ. එසේනම් ඒ දිනයන් හා රටවල් සඳහන් කරන්නේද?

04. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ආගම්.අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.11.26 දින අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/v(1)13/18)

අ. හෝමාගම - හංවැල්ල ශාන්ත ජෝන් බොස්කෝ විදුහල්පතිව සිටි එස්. කේ. කරුණාරත්න මහතාගේ කාලයේ සිදු වූවා යැයි කියන වංචා හා දූෂණ සම්බන්ධයෙන් විගණන වාර්තාවක් තිබේද?

ආ. මේ කාලයේ ආපනශාලාවෙන් අයවිය යුතු රු. 99,640/- ක් අයකිරීමට කටයුතු නොකලේ මන්ද? ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග මොනවාද ?

ඇ වැසිකිලි 05 ක වහල ඉදිකිරීම් වෙනුවෙන් රු. 815,000/- ක බිල්පත් සඳහා අදාල ආයතනවලට චෙක්පත් මගින් ගෙවීම් නොකර, කාර්ය මංඩලයේ නමින් චෙක්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් ගත් පියවර කුමක්ද?

ඈ. රුපියල් 1073260/- වටිනා වියදම් ඇස්තමේන්තු සඳහා වවුචර් පිළියෙල කිරීමෙන් තොරව විදුහල්පතිගේ නමට රු. 8,30,000/- මුදලක්ද, චාමිනි මානවඩු ගුරුතුමිය නමින් රු. 10,000/- ක්ද අයේෂ් ලක්මාල් නැමැති පාසැල් කම්කරු නමට රු. 3,510/- ක්ද සුදේශ් ගුණවර්ධන නැමැති පුස්තකාල සහායක නමින් රු. 31,500/- ක්ද වන ලෙස මුදල් ලබා ගෙන ඇති අතර, ඒ සඳහා ගත් පියවර කුමක්ද ?

ඉ. එකී කාර්ය මණ්ඩලය එම පාසැලේ සේවයේ යෙදී සිටින්නේ කෙසේද?

ඊ. කොට්ඨාශ අධ්‍යක්ෂ ආරියරත්න හා විදුහල්පති සම්බන්ධයෙන් වූ අල්ලස් හා දූෂණ චෝදනා පැමිණිල්ලට ඔබතුමා ගත් පියවර කුමක්ද?

**05.** ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින්.ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.12.03 දින **අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/v(1)13/19)**

(අ) ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පෞද්ගලික පාසල් ලියාපදිංචි කර තිබේද ?

(ආ) එම පාසැල් සංඛ්‍යාව කොපමණද ?

(ඇ) එම පාසැල් ප්‍රාථමික පාසැල් හා ද්විතික පාසැල් වශයෙන් වර්ග කොට ලියාපදිංචි කර තිබේද ?

(ඈ) නොඑසේනම් ඒ මන්ද ?

(ඉ) මෙම පෞද්ගලික පාසැල් නීති විරෝධී බව ඔබතුමා පිළිගන්නෙහිද ?

(ඊ) එසේ නම්, එම පාසැල් සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. **ගරු සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :**

"ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂිකව සිදුවන අධික පාඩුව අවම කර ගැනීම සඳහා යැයි පවසමින් පසු ගිය අප්‍රේල් මස, විදුලි බිල වැඩි කරමින් එම පාඩුවට මුදල් මහජනතාවගෙන් අය කර ගැනීමට කටයුතු කරන ලදී. වර්ෂාව නොලැබීම නිසා ජලාශ හිඳීයාම හේතුවෙන් රටේ විදුලිබල අවශ්‍යතාවයෙන් සියයට 18 ක(18%) ප්‍රමාණයක් ජල විදුලිය මගින් විදුලිය නිපදවීමට සිදුවූ බවත්, පෞද්ගලික විදුලි බලාගාර මගින් වැඩි මිලට විදුලිය මිලදී ගැනීමට හා වෙනත් ක්‍රම මගින් විදුලිය නිපදවීමට ද සිදුවූ බවත් ප්‍රකාශ විය. දැනට මාස කීපයක සිට ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව හේතුවෙන් ජලාශ පිරී ඉතිරී ගොස් සියයට 85 ක (85%) විදුලිය නිපදවීම ජලවිදුලි බලාගාර මගින් සිදු වේ. එමනිසා වැඩි කරන ලද විදුලි බිල වහාම අඩු කර මහජනතාව වෙත සහන සලසන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි"

(යෝ/v (01)13/05 )

02. **ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :**

"වසර 30 ක් තිස්සේ කුරිරු යුද්ධයකින් බැටකමින්, අනාගතය ගැන සිතන්නටවත් නොහැකිව සිටි ශ්‍රී ලංකික අපට අද මේ රට තුල කෙරෙන සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව අතිශයින් සතුටු විය හැක. එනයින් බලන කල අපගේ අනාගත පරම්පරාව අපට වඩා වාසනාවන්තයන් යැයි හැඟෙන අතර, එම සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව අපට ද ආඩම්බර විය හැක.

එමෙන්ම නොබෝදා ජනතා අයිතියට පත්කල කොළඹ - දකුණ වරාය සංවර්ධන යෝජනා ක්‍රමය ආසියාවටම ආශ්චර්යයක් එක්කල ක්‍රියා දාමයකි. එයින් අප රටේ භූගෝලීය සිතියමේ හැඩය පවා වෙනස් වී ඇති අතර, ලෝකයේ නිෂ්පාදිත ඕනෑම විශාල නෞකාවකින් අප රටට සේවය ලබා ගැනීමටත්, ලෝකයේ ඕනෑම රටකට අපගේ වරාය හරහා සේවය ලබා දීමටත්, හැකියාව ලැබී ඇත. විවිධ බලාපොරොත්තු ඇති අය කෙලෙස විවේචනය කලත්, රටට ආදරය කරන අය මෙම සුවිශේෂී වූ ක්‍රියාදාමයන් අගය කළ යුතුය. රට රැක ගැනීමට කැපවූ ශ්‍රී ලංකික පොදු ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා මෙවැනි වරායක් සකස් කර ජාතියට පවරා දීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමාටත්, වරාය අධිකාරියේ සභාපතිතුමාටත්, මෙයට දායකත්වය දුන් සියළුම නිලධාරි හා සේවක මහත්ම මහත්මීන්ටත්, වෘත්තිය සමිති වලටත් මෙම කර්තව්‍ය දැක අගය කළ සියළු දෙනාටත් මෙම බස්නාහිර පළාතේ පලාත් සභාව සිය ස්තූතිය පළකරමින් ආශිර්වාදය පුද කර සිටියි."

(යෝ/V(01)/13/06)

## X . සභාව කල් තැබීම

කේ. එච්. ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.12.06 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.